# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1772/37 - 2012 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2012.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ පුත්තලම නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන පුත්තලම නගර සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

එම්. එෆ්. එම්. ෆායිස් නම් වූ සභිකයා අයත්වන ස්වාධීන කණ්ඩායම් අංක 8 හි කණ්ඩායම් නායකයා ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ කණ්ඩායමට අයත් ඒ පුත්තලම නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ඒ. ආර්. එම්. මාහිර් මහතා ඉහත කී කණ්ඩායම් නායකයා විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පුත්තලම නගර සභාවේ තේරීම්භාර නිලධාරී නිරූක දනංග ලත්තුවාහන්දි වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඒ. ආර්. එම්. මාහිර් මහතා පුත්තලම නගර සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

නිරූක දනංග ලත්තුවාහන්දි,<br>
තේරීම්භාර නිලධාරී,<br>
පුත්තලම නගර සභාව.

2012 අගෝස්තු මස 10 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
පුත්තලම.

09 - 237